


# සත්‍යයේ ජීවත්වීම

ක්‍රිස්තුස්වහන්සේ තුළ මගේ ජීවිතය සඳහා
ප්‍රායෝගික සිද්ධාන්ත

Living The Truth

# සත්‍යයේ ජීවත්වීම

## ක්‍රිස්තුස්වහන්සේ තුළ මගේ ජීවිතය සඳහා ප්‍රායෝගික සිද්ධාන්ත

# සත්‍යයේ ජීවත්වීම
## ක්‍රිස්තුස්වහන්සේ තුළ මගේ ජීවිතය සඳහා ප්‍රායෝගික සිද්ධාන්ත

## දෙවියන්වහන්සේට හා මගේ ගැලවුම්කරුවන යේසුස් ක්‍රිස්තුස් වහන්සේට මගේ ආදරය

1. මම මගේ දෙවිවූ ස්වාමීන් වහන්සේට ප්‍රේමකළ යුතුය. මුළු හෘදයෙන්ද, මුළු ආත්මයෙන්ද, මුළු බුද්ධියෙන්ද මුළු ශක්තියෙන්ද දෙවිවූ ස්වාමීන් වහන්සේට ප්‍රේම කළ යුතුය. මෙය සියළු අණ කිරීම් වලට වඩා මහත්වූ එකය.
   **මාර්ක් 12 : 30**

2. මගේ ජීවිතයේ පළමුකොට දෙවියන් වහන්සේට සේවය කිරීම විය යුතුය. මෙයට වඩා වැදගත් වෙන දෙයක් නැත.
   **මතෙව් 6:33**

3. මගේ දැඩි කැමැත්ත විය යුත්තේ ඉතා විශ්වාසීය හා හැකි තරම් උත්සාහයෙන් දෙවියන් වහන්සේගේ සියළු කටයුතු කිරීමය.
   **මතෙව් 24 : 45-47 ක්‍රියා 20:28**

4. අකීකරු වුවත් හා අවිස්වාසීන් සහමුලින් විනාශ කරන ඔහුට මා බිය විය යුතුය.
   **2 තෙසලෝනික 1 : 7-9 මතෙව් 25:30 මතෙව් 10:28**

## සභාව සමඟ මගේ වන්දනාව

5. සතිපතා රොටි කැඩීමේදී යේසුස් වහන්සේ සිහිකරන විට මා විශ්වාසවන්ත විය යුතුය. ඉතා තද අපහසුවක් හැර මා එහි සේවයට යාම වැලැක්විය නොහැකිය.
   **මතෙව් 26:26,28, 1කොරින්ති 11:23-26 ක්‍රියා 2:42, ක්‍රියා 20 : 7**

6. මා වන්දනා රැස්වීමට කලින් යා යුතුයි. වන්දනා රැස්වීම වහාම ආරම්භ වන්නේදැයි බැලිය යුතුය. මන්දොත්සාහය යේසුස් වහන්සේට ගෞරවය නොවේ.
රෝම 12:11 1කොරින්ති 14:40

7. මා මගේ සොයුරන් උණුසුම් මිත්‍රශීලී, ඉපිලයන ආවරයකින් මුණගැසිය යුතුය.
යොහාන් 13:34 රෝම 12:10, එපීස 5:2, කොලොස්සි 3 :14, 1 තෙසලෝනික 4 :9

8. මේ සියළු සේවා කටයුතු එකගවූ උද්‍යෝගී සිතකින් කීමට හා කිරීමට උත්සාහ කළ යුතුය.
1කොරින්ති 10 : 31. 1කොරින්ති 11:29

9. ඉඳින් ප්‍රසිද්ධියේ යාච්ඤා කිරීමට ආරාධනා ලදහොත් මා නිහතමානීව හා නොගැඹුරු බසින් යාච්ඤා කළ යුතුය.
එපීස 6:18, පිලිප්පි 4 : 6, කොලොස්සි 4:2, දේශනාකාරයා 5:2

10. සභාවේ සම්මාදමට ත්‍යාගශීලිව දීමෙන් මම ස්වාමීන් වහන්සේට දුන්නා වෙමි.
2කොරින්ති 8:12-15, 2කොරින්ති 9:6-7

11. සභාවේ කටයුතු සූදානම් කිරීමට මම හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය.
1තිමෝති 4:12-16, 2 තිමෝති 2:15

## මාගේ පුද්ගලික වන්දනාව :-

12. මම අඩුතරමින් සෑම උදෑසනකම හා රාත්‍රියකම මගේම යාච්ඤා කළ යුතුය.
ලූක් 18:1, මතෙව් 6:9-13 මතෙව් 7:7



13. මම සෑම දෙයකටම දෙවියන්ට ස්තුති කළ යුතුය. ඉතා සාමාන්‍ය දෙයට පවා ද සෑම ආහාරයක් සඳහා ද කෙටි ස්තුතියක් කළ යුතුය.
එපීස 5:20, කොලොස්සි 3:15-17, 1තෙසලෝනික 5:18, හෙබ්‍රෙව් 13:15

14. මා සෑම දිනකම ශුද්ධ ලියවිලි කල්පනාවෙන් කියවිය යුතුය. ඒවාට දෙවියන්ට ස්තුති කරන අතර ඒවා හොඳින් අවබෝධ කරගැනීමට උපකාර කරන ලෙස ඉල්විය යුතුය.
යොහන් 5:39, ක්‍රියා 17:11, ක්‍රියා 20:32

15. බයිබල් ජේද බොහෝ ගණනක් ඉගෙනීමෙන් දිනපතා සාකච්ඡා වලදී ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව මගේම සාක්ෂි දීමට මට හැකිවනු ඇත.
1පේත්‍රුස් 3:15, කොලොස්සි 4:6

## සියල්ලන් සඳහා මගේ යුතුකම

16. මා කොතරම් අයෝග්‍යව සිටියද දෙවියන්වහන්සේ මට කාරුණික වූ සැටි දැන, අන් අය කොතරම් අයෝග්‍යවූ නමුත් ඒ අයට මා කරුණාව පෙන්විය යුතුය.
මතෙව් 5:44-48

17. යහපත් සමරිතානියා සිහිකරමින් මා නිතරම අවශ්‍ය අයට උපකාර කිරීමට සූදානම් විය යුතුය.
ලූක් 10:30-37, 1යොහන් 3:17, යාකොබ් 2:15-16

18. විශේෂයෙන්ම සභාවේ සිටින රෝගීන් හා මහල්ලන් පියා නැති අය හා වැන්දඹුවන්ට මට හැකි සියළු ආදරය දිය යුතුය.
රෝම 12:13, 2කොරින්ති 9:6-8, හෙබ්‍රෙව් 13:16

19. මා නිතරම සියළු ගෙවීම් වහාම කළ යුතුය.
රෝම 13:8

20. මා සතු කිසිවක් ණයට ගත්තෝ සොරා ගත් කිසිවකුට ආපසු දෙන ලෙස බල කිරීමට උත්සාහ නොකළ යුතුය.
ලූක් 6:35

21. මට සතුරු වූවන්ට පවා කුඩා හෝ මහත් කරුණු වලින් ඔවුහු මට සතුරු වුවද ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළ යුතුය. මා ඔවුන්ගේ නපුරු ක්‍රියා යහපත් කමෙන් ප්‍රතිචාරය කළ යුතුය.
ලූක් 23:34, මතෙව් 5:44, 1කොරින්ති 4:12,13, 1පේත්‍රුස් 3:9, රෝම 12:21

22. මගේ ස්වාමීන්වහන්සේගේම නිදසුනෙන් බලාත්කාරය හෝ හිංසාව කිසිම ක්‍රමයකට මට තහනම් ය.
මතෙව් 5:39, රෝම 12:17-19, මතෙව් 6 : 52

23. කොතරම් තදින් ප්‍රකෝප කලද ඉතා රළුලෙස කථාකලද මා නිතරම ආචාරශීලී විය යුතුය.
1පේත්‍රුස් 3:8,9, හෙබ්‍රෙව් 12:14, මතෙව් 26:52

24. මගේ දිනපතා කටයුතු ඉතා අවංක හා හොඳ විය යුතුය. ලොව සාමාන්‍යයෙන් ඇති වංචා සහගත ක්‍රියා සමඟ මම කිසිවක් නොකළ යුතුය.
රෝම 12:17

25. සියළු දෙයින්ම අන් අය මට කරනවාට කැමති දෙය මා අන් අයටද කළ යුතුය.
මතෙව් 7:12

## මගේ සහෝදර සහෝදරීන්ට මගේ විශේෂ යුතුකම් :-

26. මා නිතරම උත්සාහ කළ යුත්තේ අන් අයගේ වඩාත් හොඳ යහපත මිස අයහපත දැකීම නොවේ.
මතෙව් 7:12, ලූක් 6:41, 1කොරින්ති 13:4,5



27. මම දෙවියන්වහන්සේ මොනතරම් සමාව දුන්නාද යන්න සිහි කිරීමට මා ඉක්මනින් උදහස් නොවිය යුතුය.
මතෙව් 5:23,24, කොලොස්සි 3:12-14

28. මා තරවටු කිරීම් ඉවසීමෙන් හා නිහතමානිව පිළිගත යුතුය.
හෙබ්‍රෙව් 13:22, හෙබ්‍රෙව් 12:1-11, 2කොරින්ති 7:8-11

29. මට කරන සියළු හිරිහැර සඳහා මුළු හිතෙන්ම සමාව දීමට සූදානමින් සිටිය යුතුය. මා එසේ නොකරනවා නම් දෙවියන්වහන්සේ මට සමා නොකරනු ඇත.
මතෙව් 18:22,35, එපීස 4:31-32

30. සටන්කිරීම හා ශාපය ක්‍රිස්තුස්වහන්සේ තුළ මගේ ජීවිතයේ කොටසක් නොවිය යුතුය. ලෝකයා පමණක් එසේ කරති.
තීතස් 3:2, 2තිමෝති 2:24

31. මා කියන හෝ කරන කිසිවක් නිසා දුබල සොයුරන් හෝ ක්‍රිස්තුස්වහන්සේ තුළ බිළිඳුන් වරදෙහි නොවැටීමට මා සැලකිලිමත් වීම අවශ්‍යය.
රෝම 14:13 හා 21, 1කොරින්ති 8:13, මතෙව් 18:6

## මාගේ මිතුරන් හා පවුල සමඟ සබඳතාවය :-

32. මා පවත්වන සමාජය පිළිබඳව ප්‍රවේශමෙන් කටයුතු කිරීම අවශ්‍ය වේ. යේසුස් වහන්සේ අනුගමනය කිරීම සමහර මිතුරන් උපකාර කරන අතර අන් අය බාධා කරති.
1කොරින්ති 15:33, 1කොරින්ති 5:6, පිලිප්පි 4:8

33. සොයුරු සොයුරියන් සමඟ සමාජය හා සුහදතාවයද මගේ මිත්‍රයින්ද සභාව තුළ සපයාගත යුතුය.
1පේත්‍රුස් 4:3-5, එපීස 5:6-8, ක්‍රියා 2:42, හෙබ්‍රෙව් 10:24-25

34. මා විවාහයට පිටත ලිංගික හැසිරීම් හා කාම මිත්‍යාචාරයන් වැලකිය යුතුය. ලෝකය ඒවා ස්වභාවික ලෙස සිතන්නේ වුවද නොකළ යුතුය. විවාහයෙන් පිටත ලිංගික කටයුතු දෙවියන්වහන්සේගේ ඇස් හමුයේ පිලිකුලක්ද දෙවියන් වහන්සේගේ මාලිගාවවූ මාගේ සිරුර අවමානයට පත්වන්නේද වේ. මා පරීක්ෂා කරන මාගේ මිතුරන්ට, එවැනි දේ කෙරෙහි මාගේ ගණුදෙනුවක් නැති බැව් පැවසිය යුතුය.
1කොරින්ති 5:9-11, 1කොරින්ති 6:13,18,19 එපීස 5:3, 1තෙසලෝනික 4:3 මතෙව් 5:28

35. ඉඳින් මා අවිවාහකයෙකු නම් යේසුස් වහන්සේ ඉල්ලන ශුද්ධකම හා නිත්‍යානුකූලකම මා උන්වහන්සේ තුළින්ම විවාහ විය යුතුය. මගේ ජීවිතය සඳහා විශ්වාස නොකරන සහකරුවකු කර ගසා ගැනීම මහත් අනුවන කමක් වන්නේය.
1කොරින්ති 7:39, 2කොරින්ති 6:14

36. ඉඳින් මා ස්වාමිපුරුෂයකු නම් මගේ බිරිඳ ගැන මා කරුණාවෙන් සැලකිය යුතුය. ඇයට පිහිටවීමට උත්සාහ කළ යුතුය. යේසුස් වහන්සේ පවා, සභාව වෙනුවෙන් ජීවිතය පූජා කළේය.
එපීස 5:25, කොලොස්සි 3:19, 1පේත්‍රුස් 3 : 7

37. ඉඳින් මා බිරිඳක් නම්, මා මගේ ස්වාමිපුරුෂයා පවුලේ ප්‍රධානියා සේ සැලකිය යුතුය. සභාව ක්‍රිස්තුස්වහන්සේ එහි ප්‍රධානියා ලෙස සලකන්නා මෙන්ය.
එපීස 5:22-24, කොලොස්සි 3:18, 1පේත්‍රුස් 3:1

38. දික්කසාද සිතීම පවා නොකළ යුතුය. "දෙවියන්වහන්සේ එක්කල දෙය මිනිසා වෙන් නොකළ යුතුය." මතෙව් 19:4-6, 1කොරින්ති 7:10,11



39. ඉඳින් මම දෙමාපියෙක් නම්, මගේ දරුවන් සුභාරංචිය පිළිබඳ දැනුම ලැබීම හා යහපත් හැසිරීම් පුරුදු කිරීමේ උත්සාහය ලිහිල් නොකළ යුතුය. මගේ දරුවන්ට නිවසේදී නුරුස්නා ලෙස කටයුතු නොකිරීමට වගබලා ගැනීමට උත්සාහ කළ යුතුය.
එපීස 6:4, කොලොස්සි 3:21

40. දුවෙක් හෝ පුතෙක් වශයෙන්, මම දෙමාපියන්ට කීකරු විය යුතුය. ඔවුන් ස්වාමීන්වහන්සේ තුළ සිටියද නැතද ඔවුන් මට ක්‍රිස්තුස්වහන්සේගේ අණපනත් වලට අකීකරු වීමට කියන්නේ නැතිනම් මා ඔවුන්ට කීකරු විය යුතුය. මා ඔවුන්ට සුදුසු ගෞරවය දිය යුතු අතර එකට එක නොකිය යුතුය.
එපීස 6:1-2, කොලොස්සි 3:20

## මගේ දෛනික රැකියා :-

41. මා ස්වාමියෙකු නම්, මගේ සේවකයින්ට සහ වැඩ කරන මිනිසුන්ට කරුණාවන්තව යුක්ති සහගතව ඔවුන් ගැන සිතන්නෙකු විය යුතුය.
කොලොස්සි 4:1, එපීස 6:9

42. ඉඳින් මා අන් අයගේ රැකියාවක් කරන්නේ නම් මා විස්වාසවන්තව උනන්දුවෙන් වැඩකළ යුතුය. මා හොඳ කොන්දේසි හා වැටුපක් යයි සිතන අයුරින් ස්වාමියා නොගෙවන්නේ වුවත් මා මෙය කළ යුතුය.
කොලොස්සි 3:22-25, එපීස 6:5

43. මා මගේ ස්වාමියාගේ දේ මට ප්‍රයෝජන පිණිස නොගත යුතු අතර ඉතා කුඩා දෙයක්වත් පළමුවෙන් අවසර නොගෙන නොගත යුතුය.
තීතස් 2:9,10, කොලොස්සි 3:22-25

## මගේ සභාවේ ජීවිතය සඳහා මූලික කරුණු

44. මා දන්නා ලෙස සභාවේ හොඳම නිදසුන් මා අනුගමනය කළ යුතුය.
1කොරින්ති 11 : 1, පිලිප්පි 3:17, හෙබ්‍රෙව් 13:7

45. මට හැකි සෑම අයුරින්ම සුභාරංචිය දේශනා කිරීමට සහාය විය යුතු වන්නේ සියළු හමුවීම් වලට උපකාර වීමෙනි. මා අන් අයට මා සතු හා මා ප්‍රිය කරන බලාපොරොත්තු ගැන සෑම අවස්ථාවකම මා නිදහස්ව කථාකල යුතුය.
ලූක් 12:8, මාර්ක් 8:38, 2තිමෝති 1:8

46. මා සත්‍ය පිළිබඳ වචනයට බොරු ගුරුවරුන් හා මා අසත සියල්ල කෙරෙන් වෙන්වීම අවශ්‍යය.
1 තෙසලෝනික 5:21, 2 පේත්‍රුස් 2:1, මතෙව් 24:24

47. පැමිණිලි කිරීම හා මැසිවිලි කීම මහත් හානියකි. ඉතින් යම් බොහෝ වැරදිවූ අවංක කළ නොහැකි දෙයක් වේ නම් මා ඒ ගැන එම පුද්ගලයාට කිය යුතුය. ඉදින් ඔහු නොසලකන්නේ නම් මා නැවත උපදේශකයකු සමග යා යුතුය. තවදුරටත් එහි ප්‍රගතියක් නොවේ නම් මා විසින් කරුණ සභාව ඉදිරියේ තැබිය යුතුය.
පිලිප්පි 2:14,15, මතෙව් 18:15-17

48. ඉදින් මම ඊෂ්‍යාවන්ත අකැමැති කෙනෙකුට රොටිකැඩීමෙන් සහයෝගය නොදක්වන්නේ නම්, එය පිලියමක් නොවේ. එකම ක්‍රමය මගේ සිතින් අමනාපය ඉවත් කිරීමට දෙවියන්වහන්සේගෙන් ඉල්ලීමය.
1 කොරින්ති 4:5, යාකොබ් 3:14-15, 1යොහන් 4:20-21



49. කිසියම් වැරදි කටයුත්තක් පැමිණි විට, සමාව සඳහා මා ඉල්විය යුතුය.
යාකොබ් 5:16, ගීතාවලිය 32:5

50. දබර කිරීම මගේ සභාවට ඇතුළු නොවිය යුතුය. අප සියල්ලන්ට ස්වාමින්වහන්සේ තුළ එක් පවුලකි. අප්‍රිය ලෙස සැලකීමද වරදකි.
එපීස 4:29, 31, 32, කොලොස්සි 4:6, තීතස් 2:7,8

51. මා විසින් සභාව තුළ කල්ලි හෝ පාශ්වයන් සෑදීම වැලකිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ වෙන් වෙන්වූයෙක්ද?
1 කොරින්ති 1:12,13, 1කොරින්ති 3:3-4, පිලිප්පි 2:1,3

52. ක්‍රිස්තුස්වහන්සේ තුළ ජාතියක් හෝ පන්තියක් ශ්‍රේෂ්ඨතවයක් නැත. මෙය දෙවියන්වහන්සේට අප්‍රිය දෙයකි. ගලාති 3:28, එලිදරව් 7:9, ක්‍රියා 10: 34-35, යාකොබ් 2:8-9

## ලෝකයෙන් කිලුටු නොවන ලෙස ජීවත්වීම :-

53. මා සෑම විටම නපුරු සිතිවිලි වලට යොමු කරවන නරක චිත්‍රපට සඟරා හෝ පොත් කිසියම් විදියක පහත් කථා ආදියෙන් වැලකී සිටිය යුතුය.
පිලිප්පි 4:8, එපීස 5:3-4, රෝම 1:28-32, 1පේත්‍රුස් 2:11

54. මගේ කථාව දේව අපහාස කිරීම හා රළුබස්කීම ආදියෙන් වෙන්විය යුතුය. මාගේ සෑම වචනයක්ම දෙවියන්වහන්සේට ඇසීමට හැකිය.
එපීස 4:29, කොලොස්සි 3:8, මතෙව් 5:37, මතෙව් 12:36

55. ඔිපාදූපය හා කේලාම් මහත් නපුරක් බැවින් මා එයින් සහමුලින් වැලකිය යුතුය.
තීතස් 3:2, එපීස 4:31-32

56. ඉතා කුඩා හෝ කපටිකම වංචාව වරදකි. මා මගේ ජීවිතයෙන් ඒවා ඉවත් කළ යුතුය.
තීතස් 1:10, 1පේත්‍රැස් 2:1,21,22, ක්‍රියා 5:1-11, එළිදරව් 22:15

57. මා කිසිවෙකුට විරුද්ධව උසාවියේ නඩු නොකිය යුතුය. මෙය ලෝකයාගේ ක්‍රමයයි. යේසුස් වහන්සේගේ ක්‍රමය වරද තමා ඉවසාගැනීමය.
1කොරින්ති 6:1-7, මතෙව් 5:38-42

58. යේසුස්වහන්සේගේ අනුගාමිකයකු වශයෙන් මං ඡන්දයට හෝ දේශපාලන කටයුතු වලට කොටස්කරුවකු විය නොහැක. දේශපාලනය යනු මිනිසුන් කෙරෙහි විශ්වාසයකි. මගේ විශ්වාසය දෙවියන්වහන්සේ තුළ හා ඔහුගේ එන්නාවූ රාජ්‍ය පිළිබඳවයි.
2 කොරින්ති 6:14-18, 1 පේත්‍රැස් 2:11,12, 1යොහන් 1:6, 1යොහන් 2:15, යොහන් 18:36

59. මගේ පක්ෂපාතභාවය ක්‍රිස්තුස්වහන්සේ වෙත දෙන ලදුව සියළු මිනිසුන් සමග සාමයෙන් සිටීමට මට අණකර තිබේ. මා සන්නද්ධ හමුදාවට හෝ පොලිසියට නොබැඳිය යුතුය. යුධ අභ්‍යාස වල නොයෙදිය යුතුය.
මතෙව් 26:52, යොහන් 18:36



60. යේසුස්වහන්සේගේ අනුගාමිකයකු වශයෙන් මා හට කිසිදු රහස් ව්‍යාජ ආගමික සමාජයක හෝ එබඳු සමාජයක කොටස්කරුවකු විය නොහැක. (උදා : ෆ්‍රී මේසන්) අපට මේ ලෝකයට අදාළ නැති මහත් වූ සුහදත්වයක් ඇත.
1කොරින්ති 10:20-21, 2කොරින්ති 6:14-15, 1යොහන් 1:3

61. සම්පත් හඹා යෑම සහ මුදල් සහ භාණ්ඩ වලට ඇති තෘෂ්ණාව ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරන්නෙකුට නොවටී. මම සූදුව සහ ලොතරැයි වලට සහභාගීවීමෙන් ඈත් වෙමි.
මතෙව් 6:19-21, පිලෙමොන් 4:11, 1තිමෝති 6:8-10

62. මාගේ ආත්මික ජීවිතය හා සභාවේ සේවයට ලෝකය ගැන ඇති ආශාව හා එහි නපුරු ක්‍රියා වලින් ආරක්ෂා කළ යුතුය.
1 තිමෝති 6:10, 2තිමෝති 3:1-2

63. බීමත්කම වැරදි හා තහනම්ය මගේ සිත නිතරම ශුද්ධවූ දේ සිතීමට පැහැදිළි විය යුතු අතර බීමෙන් අවුල් කරගත යුතු නැත.
රෝම 13:13-14, 1තෙසලෝනික 5:6-7, එපීස 5:18

64. මා මගේ රටේ නීතිය නිසැකව පැවැත්විය යුතු අතර සුළුම දේ වෙන්ව ලොකු දෙයද සැලකිය යුතුය. ක්‍රිස්තුස්වහන්සේට විරුද්ධව යමක් කිරීමට කියන විට පමණක් එයට අකීකරු වීමට මට පුළුවන.
රෝම 13 : 1-7, 1පේත්‍රැස් 2:13-14, තීතස් 3:1

## දෙවියන්වහන්සේ ඉදිරියේ මගේ ජීවිතය ශුද්ධව තබා ගැනීම

65. මාංශයේ ආශාවන්ට විරුද්ධව මා නිතරම සටන් කිරීම අවශ්‍යය. මා මේ පිළිබඳව මා අවට ඇති දෙයට අධෛර්‍ය නොවිය යුතුය. ගලාති 5:16 හා 24, 2තිමෝති 2:22, යාකොබ් 1:3-4

66. ක්ෂණිකව කෝපවීමට ඉඩදීම වරදකි. මට එසේ ඇත්නම් නොකඩවා එය පාලනය කිරීමට සටන් කළ යුතුය.
යාකොබ් 1:19-20, හිතෝපදේශ 16:32, හිතෝපදේ 19 : 11

67. මා නිතරම සත්‍ය කිව යුතුය. බොරුකීම මහත් නපුරකි. ඒදන් උයනේදී සර්පයාගේ බොරුකීම නිසා ඇතිවූ විපාකය අප සමග තවමත් තිබේ.
එපීස 4:25, කොලොස්සි 3:9, ක්‍රියා 5:1-11, එළිදරව් 22:15

68. මා කරන සියල්ලෙන් මා යේසුස් වහන්සේගේ ශිෂ්‍යයෙකු බව පෙනිය යුතුය. මා නිතරම ඔහු ප්‍රතික්ෂේප කිරීමෙන් වැලකීමට මා ආරක්ෂා කළ යුතුය.
ලූක් 12:8, මාර්ක් 8:38, 2තිමෝති 1:8

69. මට වඩා පොහොසත් සේ පෙනෙන අන් අයට ඊර්ෂ්‍යයා නොවිය යුතුය.
ලූක් 12:15, මතෙව් 6:19, හෙබ්‍රෙව් 13:5

70. මා විසින් දෙවියන් වහන්සේගේ පාලනය හා සැපයීම මගේ ජීවිතයේ මෙසේ කියමින් "ඉදිත් දෙවියන් කැමති නම් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වේ." "දේව කරුණාවෙන් "ප්‍රකාශකළ යුතුය. යාකොබ් 4:14-15, හිතෝපදේශ 3:6



71. මා නිතරම යේසුස් වහන්සේ සිතෙහි තබා ගැනීම යුතුය. විශේෂයෙන්ම දුෂ්කරතාවකට මුහුණ දුන්විට යේසුස්වහන්සේ කරන්නේ කුමක්දැයි" මගෙන්ම ඇසිය යුතුය.
1 පේත්‍රුස් 2:21-23, යොහාන් 13:15

72. සියළු දෙයකදීම මගේ අරමුණ විය යුත්තේ පවිත්‍ර බව හා ශුද්ධවන්ත කමය. එයින් ස්වර්ගයේ සිටින මගේ ස්වාමියා සතුටු වේ. රෝම 6:19, 22, 1යොහන් 3:3, හෙබ්‍රෙව් 12:14

73. මගේ ස්වාමීන් වහන්සේගේ පැමිණීම ආසන්න බව මා විශ්වාස කරමි. මා එය ඇත්තෙන්ම විශ්වාස කරන්නකු සේ ජීවත් විය යුතුය.
මතෙව් 24:44, මතෙව් 10:37,38, ලූක් 12:35,37, 2පේත්‍රුස් 3:13,14

74. දෙවියන්වහන්සේ සතුටු කිරීමට ගන්නා මගේ උත්සාහයෙන් මම කිසිදිනක සෑහීමට පත් නොවෙමි. මා පිළිගැනීමට කැමති වන ප්‍රමාණයට වඩා මම දුර්වලය.
1 කොරින්ති 10:12, රෝම 5:12, රෝම 7:18-25

75. මා නිතරම හොඳින් කටයුතු කරනු පිණිස ධෛර්‍යමත් කිරීමට දෙවියන්වහන්සේගෙන් ඉල්විය යුතුය. ඉල්ලන යමෙක් ඔහුට මහත් උපකාර දෙනු ලැබේ. පිලිප්පි 4:6,13, යාකොබ් 1:5,6, 2 කොරින්ති 12:9, එපීස 3:16

76. මා දුර්වලව බොහෝ පව්කල විටද මා අධෛර්‍යයව එය අත්හල යුතු නැත. මා කළදෙය පිළිබඳව ඇත්තෙන්ම මා කණගාඩු වන්නේ නම් හා ඉදිරියේදී වඩා හොඳ කිරීමට තීරණය කර ගන්නේ නම් දෙවියන්වහන්සේ මට සමාව දී නැවත උත්සාහ කිරීමට උපකාර වනු ඇත.
ලූක් 15:11-32, 2 කොරින්ති 7:10, 1යොහන් 1:9